பிரதிப் பிரதம செயலாளர் அலுவலகம் (நிருவாகம்) – கிழக்கு மாகாணம்
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (පරිපාලන) - නැගෙනහිර පළාත
OFFICE OF THE DEPUTY CHIEF SECRETARY (ADMINISTRATION) - EASTERN PROVINCE

எனது இல. / මගේ අංකය. / My No. } EP/02/Circular/2014 උ_மது இல. / ඔබේ අංකය. / Your No. } திகதி. / දිනය. / Date. } 07.01.2014

චක්‍රලේඛ අංක : DCS(A)/02/2014

පළාත් සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
නැගෙනහිර පළාත.

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2013.09.23 දිනැතිව නිකුත් කර ඇති ඒකාබද්ධ සේවා චකලේඛ අංක 02/2013 සහ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක EP/07/03/Gen හා 2013.12.06 දිනැති ලිපිය හා බැඳේ.

02. කළමනාකරණ සහකාර III වන පන්තියේ නිලධාරීන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම මත එම කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා අනුගාමී විභාග වාර 04 ක් දක්වා සහන කාලයක් ලබා දීමට උක්ත චක්‍රලේඛයෙන් විධිවිධාන සලසා ඇති අතර ඊට සමානුරූපීව නැගෙනහිර පළාත් කළමනාකරණ සහකාර III වන පන්තියේ නිලධාරීන්ටද එම සහනය ලබා දීමට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

03. එබැවින් පහත දක්වා ඇති පත්වීම් දිනයන් පදනම් කර ගනිමින් අදාල සහනය නැගෙනහිර පළාත් කළමනාකරණ සහකාර III වන පන්තියේ නිලධාරීන්ටද ලබා දීමට තීරණය කර ඇත.

<table>
<tr><th>විභාග අංකය</th><th>පත්වීම් දිනය</th><th>සහනය ලබා දීමට සළකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන්</th><th>පත්වීම් දිනය</th><th>සහනය ලබා දීමට සළකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන්</th></tr>
<tr><td>01</td><td rowspan="4">2007.08.15<br>2007.12.03<br>2008.01.09</td><td>2008.08.30</td><td rowspan="4">2008.05.23<br>2008.07.01<br>2008.08.15<br>2009.01.01</td><td>2009.07.26</td></tr>
<tr><td>02</td><td>2009.07.26</td><td>2010.07.17</td></tr>
<tr><td>03</td><td>2010.07.17</td><td>2011.10.01</td></tr>
<tr><td>04</td><td>2011.10.01</td><td>2013.01.27</td></tr>
</table>

04.මේ අනුව උක්ත දිනයන්හි පත්වීම් ලද නිලධාරීන් අදාල විභාග වාර 04 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන්නේ නම් වැටුප් වර්ධක විලම්භනය නොවන අතර සෙසු නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන දිනය දක්වා පරිවාස කාලය දීර්ඝ වේ.

05. ඉහත 04 හි පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්ව මේ වන විට වැටුප් වර්ධක විලම්භනය කරන ලද නිලධාරීන්ගේ චර්යා සටහන් පත්‍රය සංශෝධනය කර වැටුප් වර්ධක ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

**කලාමදී පත්මරාජා,**

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්-පරිපාලන,

නැගෙනහිර පළාත.

கன்னியா வீதி, வரோதய நகர்,
திருகோணமலை.

කන්නියා පාර, වරෝදය නගර්,
ත්‍රිකුණාමලය.

Kanniya Road, Varothaya Nagar,
Trincomalee.

Gen. Office I : 026 2224049
Gen. Office II : 026 2222114
Admin Officer : 026 3269885

Deputy Chief Secretaty : 026 2222703
Assistant Chief Secretaty I : 026 3269883
Assistant Chief Secretaty II : 026 2222593

Fax : 026 2227161
Web :www.ep.gov.lk
E-mail : admin@ep.gov.lk